# 3 කුසුම් පිපී තුරුමතේ

මේ ගීතයෙන් කියැවෙන්නේ වසන්ත කාලයේ සුන්දරත්වය පිළිබඳ ව ය.



කුසුම් පිපී තුරුමතේ

සුවඳ හමයි දස අතේ
කෝකිල කූජනය නැගෙයි
ලියගොමු අතරේ
මධුර වසන්තේ

රේණු සැලේ වැලිතලේ
පෙති ගිලිහී දිය රළේ
ගඟ බඩ තුරු වදුලු තුළින්
කුරුලු ගී ඇසේ
මධුර වසන්තේ

ගම්මානය කෙළවරේ
පන්සල් බිම බෝ රුකේ
සිලි සිලි ගා කොළ නැටවේ
සම්බුදු මිහිරේ
මධුර වසන්තේ

අඹමල් පොකුරට වෙලා
ලෙහෙනෙකු ටිං ටිං කියා
මධුරස ගී ගය ගයා
අමරස වින්දේ
මධුර වසන්තේ

රචනය : ජෝර්ජ් පල්ලේවත්ත
ගායනය : සෝමතිලක ජයමහ

## ක්‍රියාකාරකම්

1. පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
   - i. ‘කෝකිල කූජනය’ යනු කුමක් ද?
   - ii. ලේනා ටිං ටිං ගාන්නේ කොතැනක සිට ද?
   - iii. පන්සල් බිම පිහිටා ඇත්තේ කොතැනක ද?
   - iv. කුරුලු ගීත ඇසෙන්නේ කොතැන සිට ද?
   - v. වසන්ත කාලයට පරිසරයේ ඇතිවන වෙනස්කම් 03ක් ලියන්න.
2. මෙම ගීතය ගායනා කරන්න.

## භාෂා භාවිතය

1. ගීතය කියවා පහත දැක්වෙන වාක්‍යවල හිස්තැන් පුරවන්න.

i. ................................................................... වල මල් පිපී හැම තැනම සුවඳ පැතිරෙයි.

ii. ................................................................... කෙළවරේ පන්සල පිහිටා ඇත.

iii. ................................................................... පොකුරෙහි සිට ලේනෙක් ටිං ටිං ගායි.

iv. කැලය තුළින් ................................................................... ගී රාවය ඇසේ.

v. ගඟ අසල තුරු වදුලු තුළින් ........................................................... ගී ඇසේ.

2. පහත දැක්වෙන වාක්‍යවල ඇතුළත් විශේෂණ පද මොනවා ද? වාක්‍ය නැවත ලියා විශේෂණ පද යටින් ඉරක් ඇඳ පෙන්වන්න.

උදා : මධුර වසන්තේ

i. කෝකිල කූජනය ඇසෙයි.

ii. සිසිල් සුළඟ හමයි.

iii. තුරු වදුලු තුළින් කුරුලු ගී ඇසේ.

iv. ගම්මානය කෙළවරේ පන්සල් බිම පිහිටා ඇත.

v. මේ මධුර වසන්ත කාලයයි.

3. සුදුසු ක්‍රියාපද යොදා හිස්තැන් පුරවන්න.

i. ගායිකාව ගී ...........................................................

ii. නංගි පාඩම් ...........................................................

iii. අම්මා අහර ...........................................................

iv. ගුරුතුමිය පන්තියට ...........................................................

v. අක්කා මිදුල ...........................................................

4. හිස්තැන්වලට සුදුසු පද වරහන් තුළින් තෝරා ගෙන වාක්‍ය නැවත ලියන්න.

i. (මිනිසෙක් / මිනිසෙකු) පාරේ ගමන් කරයි.

ii. (කාන්තාවක් / කාන්තාවක) කඩයට යන්නීය.

iii. මිනිසා (බල්ලෙක් / බල්ලෙකු) සමඟ මුහුදු වෙරළට යයි.

iv. කොටියා (මුවෙකු / මුවෙක්) මරයි.

v. පොලිස් භටයා (සොරෙක් / සොරෙකු) අල්ලා ගනියි.

5. පහත සඳහන් වචන අතුරින් උක්ත පද හා අනුක්ත පද වෙන් කර ඔබේ අභ්‍යාස පොතේ ලියන්න.

ගුරුවරයෙකු
ළමයා
ගවයෙකු
ගසක්
ගැහැනියක්
ගැහැනියක
දැරියක්
දැරියක
මිනිසෙක්
මිනිසෙකු
ගුරුවරයෙක්
ගවයෙක්
ළමයකු
ගස

උක්ත පද

.........................................
.........................................
.........................................
.........................................
.........................................
.........................................

අනුක්ත පද

.........................................
.........................................
.........................................
.........................................
.........................................
.........................................

6. පහත සඳහන් උක්ත පදවලට අනුරූප අනුක්ත පද ලියන්න.

උදා : මිනිස්සු  මිනිසුන්

| උක්ත පදය | අනුක්ත පදය |
|---|---|
| සොරු | ...................................... |
| ළමයා | ...................................... |
| මවුපියෝ | ...................................... |
| වඳුරෝ | ...................................... |
| ගුරුවරු | ...................................... |

7. පහත දක්වා ඇති පදවලට දිය හැකි අර්ථ දෙක බැගින් ඔබේ අභ්‍යාස පොතේ ලියන්න.

i. වත
ii. සඳ
iii. මල
iv. තුරු
v. දන

8. පහත සඳහන් අදහස් තනි වචනයෙන් ලියන්න.

i. ජලයෙහි උපන් ......................................
ii. සෑම කාලයකටම අයත් ......................................
iii. මිනිස් වාසයෙන් තොර ......................................
iv. තමන්ගේ යහපත ගැන පමණක් සිතන ......................................
v. සිත් ඇද ගන්නා සුළු......................................

9. ශ, ෂ, ස යන අකුරුවලින් සුදුසු අකුර හිස්තැනට යොදන්න.

i. ලක්..........ණ.
ii. පරීක්..........ණය.
iii. විමර්..........නය.
iv. දර්..........නය.
v. කොට්ඨා..........ය.

## පැවරුම්

1. පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරා රචනයක් ලියන්න.

   i. ගං තෙරකදී

   ii. වනයක අසිරිය

   iii. මුහුදු වෙරළේදී

2. පහත සඳහන් මාතෘකාවක් යටතේ පද්‍ය පන්තියක් නිර්මාණය කරන්න.

   i. වැසි දිනයක්

   ii. තෛපොන්ගල් උත්සවය

   iii. හිරු බැස යන මොහොතක්